New
2024/03/27

# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF-2024 චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / Your No: ……………
දිනය / திகதி / Date: 2024.03.27

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ :- 2024 / 01**

සමෘද්ධි ප්‍රජාමූල බැංකු පාලක මණ්ඩලය/බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,
සමෘද්ධි බැංකු /බැංකු සමිති කළමණාකරුවන්,
ප්‍රාදේශීය සංවිධාන සභාපතිවරුන් / ප්‍රජාමූල සංවිධාන සභාපතිවරු,

<u>සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන සඳහා හඳුන්වා දෙනු ලැබු "සමෘද්ධි අරුණළු සහන ණය" වැඩසටහන ක්‍රියාත්මක කිරීම.</u>

01. හැඳින්වීම :-

01. සමෘද්ධි සංවර්ධන වැඩසටහන යටතේ ඉලක්ක ගත ප්‍රජාව ලෙස අස්වැසුම හා සමෘද්ධි මුලාධාර ලබන ප්‍රතිලාභින්, අඩු ආදායම්ලාභින් සහ ප්‍රජාමූල සංවිධාන වල සාමාජිකත්වය ලබා ගත් පිරිසද ඇතුලත් වු විශාල කණ්ඩායමක් ඇත. මෙම ප්‍රතිලාභීන් සමෘද්ධි වැඩසටහනින් සලසන සේවා හා පහසුකම් ලබමින් තම දෛනික ජීවනෝපාය කටයුතු සාර්ථකව ඉදිරියට ගෙන යමින් සිටී.

මෙහිදි ප්‍රජාව සතු කුසලතා, හැකියාවන් සහ දැනුම යන ගුණාංගයන් හඳුනාගෙන මානසික,ආර්ථික, සමාජීය හා සංස්කෘතික වැනි අංග වලින් සවිබලගැන්වීමට විවිධ වැඩසටහන් රැසක් දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කරයි. මෙම වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලබන ඉලක්ක ගත ප්‍රජාව සමඟ සෘජුව කටයුතු කරන සමෘද්ධි බැංකු හා ප්‍රජාමූල සංවිධාන වන අතර ඒ අතරින් සමෘද්ධි බැංකුව සහ ප්‍රජාමූල සංවිධාන මගින් බැංකු සාමාජිකයා වෙනුවෙන් ණය වැඩසටහන් රැසක් හඳුන්වා දී ඇත.

ප්‍රජාමූල සංවිධාන වල අරමුණු ඉටුකර ගැනීමට මෙන්ම ප්‍රජාමූල සංවිධාන සාමාජිකයින්ගේ ව්‍යාපාරික/ දෛනික කටයුතු වලදී මතුවන හදිසි මුදල් අවශ්‍යතා වෙනුවෙන් සහනශිලි පොළියකට, කෙටිකාලින මුදල් අවශ්‍යතා සම්පුර්ණ කිරීමට "සමෘද්ධි අරුණළු" නමින් ණය වැඩසටහනක් හඳුන්වා දෙන ලදි.

මෙම ණය වැඩසටහන යටතේ ප්‍රජාමූල සංවිධානයට සමෘද්ධි බැංකුව මගින් තොග ණය මුදලක් ලබා දෙන අතර එම ණය මුදලින් ප්‍රජාමූල සංවිධානය විසින් කුඩා, කුඩා ණය මුදල් තම සාමාජිකයින්ට ලබාදීම සිදු කරයි. මෙම ණය වැඩසටහන ක්‍රියාත්මක විමත් සමග "ගමට බැංකුව" සංකල්පය බිහි වි සෑම ප්‍රජාමූල සංවිධානයකම කුඩා බැංකුවක් පිහිටු වේ.

ප්‍රජාමූල සංවිධානයට තොග ණය මුදලක් ලබා ගැනීම, සාමාජිකයින්ට කුඩා, කුඩා ණය මුදල් ලබාදීම සහ ආපසු අය කර ගැනීම හා සමෘද්ධි බැංකු ණය මුදල ආපසු ගෙවිම පිළිබඳ උපදෙස් හා මගපෙන්වීම් කිරීමට මෙම උපදෙස් පත්‍රිකාව නිකුත් කරන බව දන්වමි.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி (நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

02. අරමුණු

i. ප්‍රජාමූල සංවිධාන ජාලයේ සාමාජිකත්වය වර්ධනය කිරීම.

ii. සාමාජිකයින්ගේ ව්‍යාපාරික හා පාරිභෝගික අවශ්‍යතා වෙනුවෙන් සහනදායි ණය මුදල් ලබාදීම.

iii. ගිනි පොළීකරුවන්ගේ ග්‍රහණයෙන් සාමාජිකයන් මුදවා ගැනීම.

iv. ප්‍රජාමූල සංවිධානවල මූල්‍ය ශක්තිය ඇති කර සාමාජිකයින්ට/ පවුල්වලට මූල්‍ය සහන සැලසීම.

v. ප්‍රජාමූල සංවිධාන ජාලයේ අරමුණු ඉටුකර ගැනීම.

03. ණය ලබාදෙනු ලබන්නේ කවුරුන් සඳහාද?

පහත සුදුසුකම් සියල්ල සපුරා ඇති සාමාජිකයින්ට මෙම ණය මුදල් ඉල්ලුම් කල හැක.

i. ප්‍රජාමූල සංවිධාන සාමාජිකත්වය ලබා ගෙන තිබීම.

ii. සාමාජිකත්වය ලබා ගෙන සති 02 ක් ඉක්මවා තිබීම.

iii. ණය මුදල් ඉල්ලුම් කරන දිනට සාමාජිකයාගේ වයස අවු:70 නොඉක්මවා තිබීම.

iv. ලබා ගත් ණය මුදලක් ආපසු ගෙවීමට පිටිහිටි ණය මුදලක් නොමැති වීම.

v. මෙම වැඩසටහන යටතේ ලබා ගත් ණය මුදලක් පැහැර හැර නොතිබීම.

04. ඇප සුරැකුම්

අදාල ප්‍රජාමූල සංවිධානයේ ක්‍රියාකාරි සාමාජිකයෙකු ඇප විය යුතුය.

05. ණය ලබා දෙන කාරණාවන් හා ණය මුදල් සීමාව.

5.1. උපරිම ණය මුදල රු.10,000 කි. (එක් සාමාජිකයෙකුට)

5.2. ආදායම් උත්පාදන / පාරිභෝගික / හදිසි අවශ්‍යතා වෙනුවෙන් ණය නිකුත් කල හැක.

5.3. පහත කරුණු හේතුවෙන් උපරිම ණය මුදලට වඩා අඩු ණය මුදලක් වුවද ලබාදිය හැක.

i. ණය ලබා දීමට ඇති මුදල් සීමිත වීම.

ii. විශාල සංඛ්‍යාවක් ණය ඉල්ලීම් ලැබී තිබීම.

iii. ණයකරුගේ ණය ඉල්ලන කාරණාව.

iv. සාමාජිකයාට ණය ආපසු ගෙවීමට ඇති හැකියාව.

06. ණය මුදල ආපසු ගෙවන කාලය

i. සති 01 න්

ii. මාස 01 න් (දින 30)

iii. මාස 10 න් (සතිපතා හෝ මාසිකව ණය මුදල මාස 10 ඇතුලත ගෙවා දැමීමට ඉඩ දෙනු ලැබේ.)

ණය ආපසු ගෙවීමට අවස්ථා කිහිපයක් හඳුන්වා දී ඇතත්, සතියකින් හෝ මාසයකින් ණය ආපසු ගෙවීමට සාමාජිකයින් උනන්දු කල යුතුය. එසේ කිරීම තුලින් ප්‍රජාමූල සංවිධානයට හා සාමාජිකයින්ට වාසි හා ණය ගැනීමට අවස්ථා වැඩි වේ.

## 07. අයකරන පොළී මුදල හා ණය මුදල ආපසු ගෙවීම

### 7.1. අය කරන පොළී මුදල

| ආපසු අය කරන කාලය | ණය මුදල රු. | අය කරන පොළී මුදල (රු.) |
|---|---|---|
| සතියකින් | රු 10,000/- | රු.100/- කි . |
| මාසයකින් (දින 30) | රු 10,000/- | රු.180/- කි. (මාසයට) |
| මාස 10 ක් ඇතුලත (සතිපතා / මාසිකව) | රු.10,000/- } | සතියකට රු.50/- බැගින් (සතිපතා - 40)<br>මාසයකට රු.180/- බැගින් (මාස - 10) |

7.2. රු.10,000 ට අඩු ණය මුදලක් ලබාදෙන විටක, ලබා දෙන ණය මුදල හා ආපසු අය කරන කාලය අනුව අයකල යුතු පොළී මුදල කොපමණද? යන්න පිළිබඳ විස්තර ඇමුණුම් 01 මගින් දක්වා ඇත. රු.1000 ට වටයන ණය මුදල් පමණක් ලබා දිය යුතුය.

### 7.3.ණය මුදල ආපසු ගෙවීම.

i. සතියකින් එකවරම ණය මුදල ගෙවන විටක ණය මුදල ගත් දින සිට දින 07 ක් තුල හෝ අවසානයේ මුළු ණය මුදල, පොළීය සමඟ එකවරම ගෙවා අවසන් කල යුතුය. යම් විටක ණය මුදලින් කොටසක් ගෙවන විටක, ඉතිරි ණය මුදලට අය විය යුතු පොළී මුදල ඇමුණුම් - 01 හි සඳහන් පොළිය අය කර ගත යුතුය. තවද යම් ණයකරුවෙකු සතිය තුල ණය මුදල නොගෙවන විටක, ඊලග සතියටද සම්පූර්ණ පොළී මුදල අය කරගත යුතුවේ. එලෙස ණය මුදල අය කරන තුරු පොළී අය කරයි.

ii. මාස 01 න් (දින 30) ණය මුදල ගෙවන විටක ණය මුදල ගත් දින සිට දින 30 අවසන් වී එළඹෙන පළමු දිනය ණය මුදල හා පොළී මුදලම එකවර ගෙවා ණය මුදල පියවිය යුතුය. මාසය ඇතුලත කොටස් වශයෙන් ණය මුදල ගෙවා අවසන් කල හැක. එවිටද අයකල යුතු මුළු පොළී මුදල රු. 180 කි. නියමිත දිනට මුළු ණය මුදලම ගෙවා අවසන් නොකර ණය මුදලෙන් කොටසක් ගෙවන විටක ඉතිරි මුදලට ඇමුණුම - 01 පරිදි මාසයට පොළිය අයවිය යුතුය. තවද යම් ණයකරුවෙකු මාසය තුල ණය මුදල නොගෙවන විටක ඊලග මාසයට ද සම්පූර්ණ පොළී මුදලම අය කරගත යුතුවේ. එලෙස ණය මුදල ගෙවා අවසන් කරන තුරු පොළී අය කරනු ලබයි.

iii. මාස 10 ක් ඇතුලත සති/මාසික වාරික වලින් ණය ගෙවීමට ඉඩ දෙනු ලැබේ. එහිදී සෑම සතියකම/මාසයකම අවසානයේ දි පොළී මුදල හා ණය වාරිකය සමග වාරික මුදල ගෙවිය යුතුය. යම්කිසි අවස්ථාවක මාස 10 අවසන් වූ පසු එකවර ණය මුදල ගෙවීමට ඉඩදෙනු නොලැබේ. එම ණය පැහැර හැරි ණය වේ. එවැනි අවස්ථාවක ණයකරුගෙන් එකවර ණය මුදල අයකර ගත යුතුවේ.

iv. ඉහත උපදෙස් මත එකඟ වූ කාලය තුල ණය මුදල්/ වාරික මුදල නොගෙවන විටක ප්‍රජාමූල සංවිධානයේ මහා සභා රැස්වීමකදී ලබා ගත් තීරණයන් මත සාධාරණ දඩ පොළියක්, ණය පොළියට අමතරව අය කල හැක.

v. ණය අය කර ගැනීමේදී, පළමුව ණය පොළිය අයකර ගත යුතු අතර ඉන් අනතුරුව ණය මුදල වාරිකය අය කර ගත යුතුය. දඩ මුදලක් අය කරන අවස්ථාවකදී මුලින්ම දඩ පොළිය අය කර ගත යුතුය.

vi. ණයකරු ලබා දෙන මුදලින්, දඩ මුදල, පොළිය හෝ ණය වාරිකය යන එකක්වත් (1) හිලව් කර ගැනීමට ප්‍රමාණවත් නොවන විටක මුදල භාර ගැනීම නොකල යුතුය.

vii. මාස 10 න් නැවත අය කර ගැනීම් සඳහා ණය මුදල ගෙවන විටක, ණය මුදල ආපසු ගෙවන කාලය සති / මාස ගණනින් බෙදා ණය වාරිකය සකස් කර ගත යුතුය.

1. සතිපතා ගෙවන විටක

උදා -: රු.10,000.00 ණය මුදලක් මාස 10 තුළ ගෙවා අවසන් කිරීමට එකඟ වන විටක, එම ණය මුදලෙහි සති ණය වාරිකය සකස් කර ගැනීම පහත පරිදි වේ.

සති ණය වාරිකය $= \frac{\text{ණය මුදල}}{\text{කාලය}} = \frac{10{,}000.00}{\text{සති } 40} =$ රු.250.00

සතියේ මුළු ණය වාරිකය = ණය පොළිය (රු.) +ණය වාරිකය(රු.)

= රු.50.00 + රු.250.00

= රු.300.00 කි.

2. මාස්පතා ගෙවන විටක

ආපසු ගෙවන මාස ගණනින් ණය මුදල බෙදා මාසික ණය වාරික සකස් කර ගත යුතුය.

උදා -: රු.10,000.00 ණය මුදලක් මාසිකව මාස 10 ක් තුළ ගෙවා අවසන් කිරීමට එකඟ වන විටක,

මාසික ණය වාරිකය $= \frac{10{,}000.00}{10} =$ රු.1,000.00

මාසයේ මුළු ණය වාරිකය = ණය පොළිය (රු.) + ණය වාරිකය(රු.)

= රු.180.00 + රු.1,000.00

= රු.1,180.00 කි

7.4. නියමිත දිනයට ණය මුදල හෝ කොටසක් හෝ පොළී මුදල නොගෙවන විටක, ණය මුදල ගෙවා අවසන් වන තුරු ආපසු ගෙවීමේ කාලයට අදාල වූ පොළී මුදල ණයකරු ගෙවිය යුතුය. යම් පිළිගත් හේතුවක් මත ණය මුදල ගෙවීමට නොහැකි වන විටක පමණක් සිදු වූ ආපදාව / කාරණාවෙහි සත්‍යතාවය සොයා බලා ණයකරුවන්ට සහනයක් ලබා දීම ප්‍රජාමූල සංවිධානයට ඉඩ දෙනු ලැබේ.

7.5. එකඟ වූ පරිදි ණය නොගෙවන හෝ පැහැර හරින ණයකරුවන්ට නව ණය මුදල් ලබා දීම සලකා බැලීම හා ලබා දිය යුතු ණය මුදල තීරණය කිරීම ප්‍රජාමූල සංවිධාන සාමාජිකයින්ගේ වැඩි කැමැත්ත මත කල යුතුය. මෙහිදී ගැටළු ඇති වුවහොත් සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරුට ලිඛිතව දැනුම් දී ලබා දෙන උපදෙස් මත කටයුතු කළ යුතුය.

08. ණය මෙහෙයුම් කමිටුව පිහිටුවීම හා මෙහෙයුම් කමිටුවේ බලතල

8.1. ණය මෙහෙයුම් කමිටුව පිහිටුවීම.

i. ප්‍රජාමූල සංවිධාන සභාපති.

ii. ප්‍රජාමූල සංවිධාන ලේකම්.

iii. ප්‍රජාමූල සංවිධාන භාණ්ඩාගාරික.

8.2. ණය මෙහෙයුම් කමිටුවේ බලතල.

i. අරමුදල් ලබා ගැනීම හා මෙහෙයවීම.

ii. ණය ඉල්ලීම් ලබා ගැනීම හා අනුමත කිරීම.

iii. සාමාජිකයින්ට ණය ලබාදීම හා අයකර ගැනීම.

iv. ගිණුම් සටහන් තැබීම, වාර්තා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම.

v. ප්‍රජාමූල සංවිධාන රැස්වීම් සඳහා වාර්තා ඉදිරි පත් කිරීම.

vi. නිසි පරිදි ණය අය කර ගැනීම හා පැහැර හරින ණයකරුවන් දැනුවත් කිරීම හා දී ඇති උපදෙස් මත ණය අය කර ගැනීම.

vii. ලබාගත් සමෘද්ධි බැංකු ණය මුදල හා පොළී මුදල් ආපසු ගෙවීම.

viii. ණය ඉල්ලුම්කරුගේ ණය ඉල්ලීමේ අවශ්‍යතාවය අනුව ආවරණ අනුමැතියට යටත්ව භාණ්ඩාගාරික විසින් ණය මුදල් නිකුත් කර පසුව සභාපතිගේ අනුමැතිය ලබා ගැනීමටද ඉඩ දෙනු ලැබේ.

09. ණය අනුමත කිරීම, මුදාහැරීම සහ අයකර ගැනීම.

9.1. ණය අනුමත කිරීම ප්‍රජාමූල සංවිධාන සභාපති විසින් සිදු කල යුතුය. සභාපති නොමැති විටක, ආවරණ අනුමැතියට යටත්ව ණය දීමට හැකියාව ඇත.

9.2. ණය ලබා ගත් සාමාජිකයා විසින් පොරොන්දු වූ පරිදි අදාල දිනට එකවර / වාරික වශයෙන්, පොළී මුදල සමඟ ණය මුදල / වාරික භාණ්ඩාගාරික වෙත භාර දිය යුතුය.

9.3. පොරොන්දු වූ පරිදි ණය මුදල නොගෙවන විටක, පොළී මුදල සමඟ මුළු ණය මුදලම එකවර අය කර ගත යුතුය.

9.4. ලබා ගත් ණය මුදල ගෙවා ගෙන යන අතරතුර ණයකරු මිය ගියහොත්, කාලත්‍රයා හෝ පවුලේ සාමාජිකයින්ගෙන් පොළී මුදල සමඟ ණය මුදල අය කර ගත යුතු වේ. එසේ නොගෙවන විටක ඇපකරුගෙන් පොළී මුදල හා ණය මුදල අය කර ගත යුතුය. මෙවැනි අවස්ථාවක ණය පොළිය හා දඩ මුදල සම්බන්ධ සහනයක් ලබා දීමේ බලය ප්‍රජාමූල සංවිධානයට පවරනු ලැබේ.

9.5. ණය පැහැර හරින ණයකරුවන් සම්බන්ධව, ප්‍රජාමූල සංවිධාන රැස්වීම් වලට ඉදිරිපත් කර එහිදී ලබා දෙන උපදෙස් අනුව කටයුතු කල යුතුය. ඉන් අනතුරුව ද ණය නොගෙවන විටක ණයකරුවන් පිළිබඳ ප්‍රාදේශීය සංවිධානය වෙත ලිඛිතව දන්වා උපදෙස් ලබා ගත යුතුය.

9.6.මෙම ණය වැඩසටහන සමෘද්ධි බැංකු ණය මුදලක් ලබා ගෙන ක්‍රියාත්මක වන බැවින් සාමාජිකයින්ට ලබා දෙන සියළුම ණය මුදල් ආපසු අයකර ගත යුතුය. ජීවත්ව සිටින සාමාජිකයින් ණය ආපසු නොගෙවා පැහැර හරින විටක, කඩිනමින් සමථ මණ්ඩලය / පොලීසියට පැමිණිලි කර මුදල් ආපසු අය කර ගැනීමට අවස්ථාව ඇත. මේ සම්බන්ධ පැමිණිල්ල , ප්‍රජාමූල සංවිධානයේ සභාපති/ ලේකම් විසින් ඉදිරිපත් කල යුතු අතර ඒ සඳහා උපදෙස් බැංකු කළමණාකරු වෙතින් ලබා ගත යුතුය.

9.7. ණය මුදල නැවත අය කර ගැනීමට කිසිදු මාර්ගයක් නොමැති විටක පමණක් ඉදිරිපත් කරන / ඉදිරිපත් වූ කරුණු වල සාධාරණත්වය සලකා බලා ප්‍රාදේශීය සංවිධානයේ අනුමැතිය ලබා ගෙන ප්‍රජාමූල සංවිධානයේ සාමාජිකයින්ගේ එකඟතාවය ඇතිව ණය මුදල හා අයවිය යුතු පොළිය කපා හැරිය හැක.

10. **භාවිතා කල යුතු පොත්පත්**

i. ණයකරුවන්ගේ ණය ලෙජරය.
ii. ණය පොළී ලෙජරය.
iii. තොග ණය ලෙජරය.
iv. මුදල් පොත.
v. බැංකු පොත.
vi. ප්‍රගති වාර්තා ගොනුව

11. **ණය ලබා දීමට මුදල් සොයා ගැනීම**

11.1. අරමුදල් ලැබෙන මාර්ග

i. සමෘද්ධි බැංකුව මඟින් ලබා ගන්නා අරුණළු ණය මුදල
ii. ණය ලබා දී උපයන පොළී මුදල
iii. අය කර ගත් ණය වාරික මුදල්

ඉහත අරමුදල් මුලාශ්‍ර හැර ප්‍රජාමූල සංවිධානයේ සතු වෙනත් අරමුදල් භාවිතා කල නොහැක. මෙම ණය වැඩසටහන සඳහා සමෘද්ධි බැංකුවෙන් අරුණළු ණය මුදලක් ලබා ගැනීම අනිවාර්යය වේ.

11.2. **සමෘද්ධි බැංකුවෙන් ලබා දෙන අරුණළු ණය වැඩසටහන පිළිබඳ විස්තර**

i. උපරිම ණය මුදල රු.300,000.00 කි.
ii. උපරිම ණය මුදලක් සඳහන් කර ඇතත්, පළමු (ආරම්භක) ණය මුදල රු.50,000.00 කි. ඉන් අනතුරුව ඉතිරි කිරීමේ ගිණුමේ 25% ශේෂය හා සාමාජිකයින්ගේ ණය ඉල්ලීම් තවදුරටත් සලකා බලා ණය ලබාදීම සමෘද්ධි බැංකුව විසින් සිදු කල යුතුය.
iii. ණය වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක වන ප්‍රජාමූල සංවිධාන සඳහා රු.300,000.00 ඉක්මවා ණය මුදල් ලබා ගැනීමට අවශ්‍ය විටක ලිඛිත ඉල්ලීමක් සිදු කර විශේෂ අනුමැතිය අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ලබාගත යුතුය.
iv. වාර්ෂික පොළී අනුපාතය 15% කි. (හීනවන ශේෂය මත)
v. ආපසු ගෙවීමේ උපරිම කාලය මාස 36 කි. (අවුරුදු 03)
vi. මාසිකව ණය මුදලේ පොළිය බැංකුවට අනිවාර්යයෙන් ගෙවිය යුතු අතර ණය මුදල මාසිකව/කොටස් වශයෙන්/එකවර ගෙවා අවසන් කිරීමට ඉඩදෙනු ලැබේ.

vii. සමෘද්ධි බැංකුවෙන් ලබා ගන්නා ණය මුදලට ඇප ලෙස , ප්‍රජාමූල සංවිධාන ඉතිරි කිරීමේ ගිණුමේ ශේෂයෙන් 25% හෝ ඊට වැඩි මුදලක් විය යුතුය.

viii. ණය සංරක්ෂණ වැඩසටහන මෙම ණය සඳහා වලංගු නොවේ.

ix. ණය මුදල නොගෙවන විටක, ප්‍රජාමූල සංවිධානයේ සාමාජික නොවන ඉතිරි කිරීමේ ගිණුමේ තැන්පතු මුදලින් හිලව් කර ගත හැකිය.

x. ප්‍රජාමූල සංවිධානයේ කටයුතුවල ක්‍රියාකාරිත්වය අසතුටුදායක නම් බැංකුවට මුළු පිටිහිටි ණය මුදල හා පොළී මුදල සමඟම එකවර ගෙවන ලෙස නියෝග කල හැකිය.

xi. බැංකුවෙන් ලබා ගන්නා සමෘද්ධි අරුණළු ණය මුදලක් මාස 36ක කාලයක් තුල ගෙවා අවසන් කිරීමට ඉඩ දෙන අතර, ඉන් අනතුරුව ප්‍රජාමූල සංවිධානයේ ඉල්ලීම මත පවතින ගිවිසුම අළුත් කර ණය මුදල තවත් මාස 36 ට ඉදිරියට ගෙන යා හැක. ඒ සඳහා පාලක මණ්ඩල අනුමැතිය අවශ්‍ය වේ. තවද ප්‍රජාමූල සංවිධානයේ මූල්‍ය ශක්තිය හා ක්‍රියාකාරිත්වය පිළිබඳ සොයා බැලිය යුතුය.

12. **ණය මෙහෙයුම් කමිටුවේ නිලධාරින්ට මාසික දීමනා ලබා දීම.**

i. ණය මුදල් ලබා දීම අනුව පහත පරිදි භාණ්ඩාගාරිකට මාසික දීමනාවක් ගෙවීමට ඉඩ දෙනු ලැබේ.

| පිටිහිටි ණය මුදලෙහි එකතුව (රු) (සාමාජිකයින්ට නිකුත් කල) | මාසික දීමනාව (රු.) |
|---|---|
| රු.100,000 හෝ ඊට අඩු | 250 |
| රු. 100,001සිට රු200,000 දක්වා | 500 |
| රු.200,001 ට වැඩි | 750 |

ii. දීමනා සඳහා එක් එක් මාසයේ අවසානයේ පවතින පිටිහිටි ණය ශේෂය පදනම් කර ගත යුතුය.

iii. මීට අමතරව මෙම ණය රාජකාරි කටයුතු වෙනුවෙන් ඔවුන් දරන ලද ගමන් වියදම් ප්‍රජාමූල සංවිධානය විසින් භාණ්ඩාගාරිකට සහ සභාපතිට ලබා දිය යුතුය.

iv. මෙම මාසික දීමනාව ඉහල නැංවීම අධ්‍යක්ෂ ජනරාල් සතු වන කාර්යයක් බව දන්වමි.

13. ප්‍රජා මූල සංවිධානය විසින් සාමාජිකයින්ට ලබාදෙන ණය සඳහා ණය සංරක්ෂණ වැඩසටහන ආදාල නොවේ. එබැවින් මින් ඉදිරියට දායක මුදල් බැංකු සමිතියට යැවීම නොකල යුතුය.

14. සෑම ග්‍රාම නිලධාරි වසමකම අරුණළු ණය වැඩසටහන අනිවාර්යෙන් ක්‍රියාත්මක විය යුතු අතර තම වසම තුල අදාල ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන ක්‍රියාවට නැංවීම වසම් භාර සංවර්ධන නිලධාරිගේ වගකීමක් වේ. සෑම බැංකු බල ප්‍රදේශයකටම අයත් සියළුම වසම් වල මෙම අරුණළු ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරුවන්ගේ අනිවාර්ය වගකීමක් වේ. ඉහත සඳහන් අරමුණු ජය ගැනීමට අපේක්ෂා කරන බැවින් ප්‍රජාමූල සංවිධානයට හා සාමාජිකයින්ට වාසි හා සහන ලැබෙන පරිදි සෑම ප්‍රජාමූල සංවිධානයකම අරුණළු ණය වැඩසටහන ක්‍රියාත්මක විය යුතු බව දන්වමි.

15. මෙම වැඩසටහන අධීක්ෂණය වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී, කලාප සහකාර බැංකු කළමණාකරු, විෂයභාර සංවර්ධන නිලධාරී (DO) ,බැංකු සමිති කළමණාකරු විසින් අනිවාර්යෙන්ම සිදු කල යුතුය.

16. තොරතුරු හා ප්‍රගතිය වාර්තා කිරීම

i. සෑම මසකම ප්‍රජාමූල සංවිධානයේ මාසික රැස්වීමට පහත තොරතුරු ඉදිරිපත් කල යුතුය.
   - මාසය තුල දුන් ණය තොරතුරු.
   - පැහැර හැරි ණයකරුවන් පිළිබඳ තොරතුරු
   - ඉදිරියට ණය ලබා දීමට ඇති මුදල් පිළිබඳ තොරතුරු.
   - සමෘද්ධි බැංකුවෙන් ලබා ගත් ණය මුදලේහි පිටිහිටි ණය මුදල ,මාසිකව ගෙවන ලද පොළී මුදල් විස්තර.

ii. ප්‍රජාමූල සංවිධානයේ භාණ්ඩාගාරික විසින් ඇමුණුම - 02 පරිදි, ණය තොරතුරු සකස් කර වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරි වෙත ලබාදිය යුතුය. මෙම වාර්තාව සෑම මාසයක් අවසන් වී, ඊලඟ මාසයේ 05 දිනට පෙර දිය යුතුය.

iii. සමෘද්ධි සංවර්ධන නිලධාරින් විසින් බැංකු කළමණාකරුට සෑම මසකම 10 දින හෝ ඊට පෙර ඉදිරිපත් කල යුතුය.

iv. සමෘද්ධි බැංකු කළමණාකරු විසින් සෑම මසකම 15 දිනට පෙර බැංකු සමිතියටද, සමෘද්ධි බැංකු සමිති කළමණාකරු සෑම මසකම 20 දිනට පෙර දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙතද දිස්ත්‍රික්කයේ සියළුම තොරතුරු ඒකරාශී කර සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රජාමූල සංවිධාන අංශයේ samurdi.cbo@yahoo.com විද්‍යුත් ලිපිනය වෙත 25 දිනට පෙර එවිය යුතුවේ. දිස්ත්‍රික් මාසික වාර්තාව සකස් කිරීමට ඇමුණුම - 03 භාවිතා කළ යුතුය.

17. මෙම ණය වැඩසටහන සඳහා ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් උපදෙස් ලබාදීම, මගපෙන්වීම හා අධික්ෂණය සඳහා නිළධාරියකු ඉදිරියේදි පත් කිරීමට අපේක්ෂා කෙරේ.

18. මෙම චක්‍රලේඛය සඳහන් උපදෙස් 2024.02.01 දින සිට ක්‍රියාත්මක වන අතර ඊට පෙර ලබා දුන් ණය මුදල් සඳහා සමෘද්ධි චක්‍රලේඛ : ප්‍රජාමූල/11/2020/02 දරණ 2021.02.22 දිනැති චක්‍රලේඛ උපදෙස් තවදුරටත් වලංගුවේ.

සී.ඩී.කළුආරච්චි,
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්:-

01. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් - දැ.ගැ.ස. හා අ.ක.ස.
02. සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් - දැ.ගැ.ස. හා අ.ක.ස.
03. සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන් - දැ.ගැ.ස.
04. සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරුන් - අ.ක.ස.
05. ප්‍රජාමූල විෂයභාර දිස්ත්‍රික් කළමණාකරුවන් - අ.ක.ස.
06. ප්‍රජාමූල විෂය භාර සංවර්ධන නිලධාරින් - අ.ක.ස.
07. සියළුම සමෘද්ධි සංවර්ධන නිලධාරින් - අ.ක.ස.

**ඇමුණුම - 01**

**7.2. ලබා දෙන ණය මුදල අනුව අයකරන ණය පොළී මුදල ගනණය කිරීම.**

| ණය මුදල රු. ශත | ආපසු ගෙවන කාලය අනුව අයකළ යුතු පොළී මුදල රු. ශත | | | |
|---|---|---|---|---|
| | සති - 01 | මාස - 01 | මාස - 10 | |
| | | | මාස - 10 | මාසිකව |
| 10,000.00 | 100.00 | 180.00 | 50.00 | 180.00 |
| 9,000.00 | 90.00 | 162.00 | 45.00 | 162.00 |
| 8,000.00 | 80.00 | 144.00 | 40.00 | 144.00 |
| 7,000.00 | 70.00 | 126.00 | 35.00 | 126.00 |
| 6,000.00 | 60.00 | 108.00 | 30.00 | 108.00 |
| 5,000.00 | 50.00 | 90.00 | 25.00 | 90.00 |
| 4,000.00 | 40.00 | 72.00 | 20.00 | 72.00 |
| 3,000.00 | 30.00 | 54.00 | 15.00 | 54.00 |
| 2,000.00 | 20.00 | 36.00 | 10.00 | 36.00 |
| 1,000.00 | 10.00 | 18.00 | 5.00 | 18.00 |

ඇමුණුම් - 02

**සමෘද්ධි අරුණළු ණය වැඩසටහනෙහි මාසික ප්‍රගතිය ලබා ගැනීම - 2024**

**දිස්ත්‍රික් සාරාංශ වාර්තාව**

**ප්‍රජාමූල සංවිධාන හා ක්‍රීඩා අංශය.**

දිස්ත්‍රික්කය :- ..............................                                        දිනට ප්‍රගතිය :- ..............................................

| අනු අංකය | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | බැංකුවේ නම | වසම් සංඛ්‍යාව | ප්‍රජාමූල සංවිධාන සංඛ්‍යාව | අරුණළු ණය නිකුත් කල (සමුච්චිත ප්‍රගතිය) | | | | අරුණළු ණය නිකුත් නොකල | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | වසම් සංඛ්‍යාව | ප්‍රජාමූල සංවිධාන සංඛ්‍යාව | මුදාහල ණය සංඛ්‍යාව | මුදාහල ණය මුදල් එකතුව රු. ශත | ප්‍රජාමූල සංවිධාන සංඛ්‍යාව | වසම් සංඛ්‍යාව |
| 1 | | | | | | | | | | |
| 2 | | | | | | | | | | |
| 3 | | | | | | | | | | |
| 4 | | | | | | | | | | |
| 5 | | | | | | | | | | |
| 6 | | | | | | | | | | |
| 7 | | | | | | | | | | |
| 8 | | | | | | | | | | |
| 9 | | | | | | | | | | |
| 10 | | | | | | | | | | |
| එකතුව | | | | | | | | | | |

ඉහත සඳහන් සමෘද්ධි අරුණළු ණය නිකුත් කිරිමේ වාර්තාව නිවැරදි බව සහතික කරමි.

සකස් කලේ.                                        සහතික කලේ.

......................................                                        ...............................................

දිස්ත්‍රික් විෂය කළමණාකරු.                                        දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ.

සැ.යු :- ආරම්භක අවස්ථාවේ සිටම තොරතුරු ඇතුලත් කල යුතුයි.එමෙන්ම අදාල මාසයට පෙර මාසයේ ඉදිරිපත් කරන ලද ප්‍රගති තොරතුරු සමඟ සංසන්දනය කර නිවැරදි තොරතුරු ලබා දීමට කාරුණික වන්න.

ඇමුණුම් -03

## සමෘද්ධි අරුණළු ණය වර්ගීකරණයට අනුව මාසික ප්‍රගතිය ලබා ගැනීම - 2024

## දිස්ත්‍රික් සාරාංශ වාර්තාව

**ප්‍රජාමූල සංවිධාන හා ක්‍රීඩා අංශය.**

දිස්ත්‍රික්කය :- ............................................

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | සමෘද්ධි බැංකුවේ නම | සමෘද්ධි බැංකුවෙන් නිදහස් කල අරුණළු ණය විස්තර | | ප්‍රජාමූල සංවිධානය විසින් මුදාහල අරුණළු ණය වර්ගීකරණය අනුව ණය සංඛ්‍යාව | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | * මුදාහල ණය මුදල රු. | * පිටිහිටි ණය මුදල රු. | ස්වයං රැකියා /ව්‍යාපාරික මුදාහල | | පාරිභෝගික මුදාහල | | ගැහැණු සංඛ්‍යාව | පිරිමි සංඛ්‍යාව | මුළු ණය සංඛ්‍යාව |
| | | | | | ණය සංඛ්‍යාව | මුදල රු. | ණය සංඛ්‍යාව | මුදල රු. | | | |
| 1 | | | | | | | | | | | |
| 2 | | | | | | | | | | | |
| 3 | | | | | | | | | | | |
| 4 | | | | | | | | | | | |
| 5 | | | | | | | | | | | |
| 6 | | | | | | | | | | | |
| එකතුව | | | | | | | | | | | |

*සමෘද්ධි බැංකුවෙන් මුදාහල ණය මුදල හා පිටිහිටි ණය මුදල :- ප්‍රජාමූල සංවිධාන වෙත අරුණළු ණය ලබා දීම ආරම්භ කල දින සිට වාර්තා කරන දිනය දක්වා මුදාහල ණය මුදල හා පිටිහිටි ණය මුදල සහ අනෙකුත් සියළුම අගයන් සමුච්චිත අගයන් ලෙස සටහන් කල යුතුය.

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව සහතික කරමි.

සකස් කලේ :- 

.........................................

දිස්ත්‍රික් විෂය කළමණාකරු

සහතික කළේ :-

.........................................

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ

සැ.යු :- ආරම්භක අවස්ථාවේ සිටම තොරතුරු ඇතුලත් කල යුතුයි. එමෙන්ම අදාල මාසයට පෙර මාසයේ ඉදිරිපත් කරන ලද ප්‍රගති තොරතුරු සමඟ සංසන්දනය කර නිවැරදි තොරතුරු ලබා දීමට කාරුණික වන්න.

ඇමුණුම් - 04

**සමෘද්ධි අරුණළු ණය නිකුත් නොකිරිම පිළිබඳ තොරතුරු ලබා ගැනීම - 2024**
**දිස්ත්‍රික් සාරාංශ වාර්තාව**
**ප්‍රජාමූල සංවිධාන හා ක්‍රීඩා අංශය.**

**දිස්ත්‍රික්කය :- ..............................**

**දිනට :- ....................................................**

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | අරුණළු ණය නිකුත් නොකල | | |
|---|---|---|---|---|
| | | බැංකුවේ නම | වසමේ නම | සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයේ නම |
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| 4 | | | | |
| 5 | | | | |
| 6 | | | | |
| 7 | | | | |
| එකතුව | | | | |

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව සහතික කරමි.

සකස් කලේ. | සහතික කලේ.

......................................, | ............................................
දිස්ත්‍රික් විෂය කළමණාකරු | දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ

සැ.යු :- ආරම්භක අවස්ථාවේ සිටම තොරතුරු ඇතුලත් කල යුතුයි. එමෙන්ම අදාල මාසයට පෙර මාසයේ ඉදිරිපත් කරන ලද ප්‍රගති තොරතුරු සමඟ සංසන්දනය කර නිවැරදි තොරතුරු ලබා දීමට කාරුණික වන්න.